| 2023<br>අගෝස්තු | **ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**<br>*නිෂ්පාදන සහ සේවා* | STATISTICS DEPARTMENT<br>CENTRAL BANK OF SRI LANKA |
|---|---|---|

## 2023 අගෝස්තු මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් සේවා ක්‍රියාකාරකම්වල ඉහළ යෑමක් ද නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සුළු වශයෙන් පහළ යෑමක් ද පෙන්නුම් කරන ලදී.

**පසුගිය මාසවලට සාපේක්ෂව නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වැඩිදියුණු වීමක් සළකුණු කරමින්, ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2023 අගෝස්තු මාසයේදී දර්ශකාංක 49.3ක අගයක් වාර්තා කරමින් කඩඉම් මට්ටම කරා ආසන්න විය.** තවද, උප-දර්ශක සලකන විටදී, නව ඇණවුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසයේදී ඉහළ ගිය අතර නිෂ්පාදන සහ සේවා නියුක්තිය තවදුරටත් කඩඉම් මට්ටමට පහළ අගයක පැවතුණි.

| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**<br>**2023 අගෝස්තු** | **49.3** |
|---|---|

නව ඇණවුම් දර්ශකයේ සමස්ත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය දායක වූ අතර, මේ සඳහා පසුගිය කාලය පුරා අඛණ්ඩව සිල්ලර මිල ගණන් පහත හෙලීම හේතු වූ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරිත්වය සමස්තයක් වශයෙන් ඉහළ යෑමක් මෙම මාසය තුළ දක්නට ලැබුණු බව එම අංශයට අදාලව ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. මේ අතර, නිෂ්පාදන අංශයේ අඛණ්ඩ පහළ යෑම සඳහා මූලික වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ පසුබෑම හේතු වූ අතර, පවතින ගෝලීය ඉල්ලුමෙහි පහත වැටීම මේ සඳහා බලපාන ලදී. එසේම, අගෝස්තු මාසයේදී ද සේවා නියුක්තිය පහත වැටුණු අතර, තොග මිලදී ගැනුම් නොවෙනස්ව පැවතුණි. තවද, පෙර මාසයට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේදී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූලි. | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 44.6 | 49.3 | + | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | **උප-දර්ශක** | | |
| නව ඇණවුම් | 47.5 | 53.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 41.9 | 48.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 41.9 | 43.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 47.0 | 50.0 | + | පහළ යෑමක සිට නොවෙනස්ව පැවතීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 45.5 | 51.0 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන්, ආනයන සීමා ලිහිල් කිරීම, ණය පොලී අනුපාතිකවල පහත වැටීම සහ අමුද්‍රව්‍ය මිල අඩු වීම හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පැවතුණි.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.4කින් ඉහළ යමින් 2023 අගෝස්තු මාසයේ දී 49.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

චීනය, ඉන්දියාව, සිංගප්පූරුව සහ රුසියාව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 සැප්තැම්බර් 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, සේවා ක්‍රියාකාරකම්හි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, 2023 අගෝස්තු මාසයේ දී දර්ශකාංක 57.6ක් වාර්තා කළේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය. කෙසේ වුවද, අගෝස්තු මාසය තුළ දී සේවා නියුක්තිය නොවෙනස්ව පැවති අතර, නිමකිරීමට නියමිත කාර්යයන් අඩු අගයක පැවතුනි.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.6**

**2023 අගෝස්තු**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, තොග සහ සිල්ලර වෙළඳාම, අනෙකුත් පෞද්ගලික සේවා, වෘත්තීය සේවා සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 ජූලි මාසයට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

උප අංශ කිහිපයක ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කරමින්, 2023 අගෝස්තු මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, සංචාරක පැමිණීම් ඉහළ යෑම හේතුවෙන්, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා යන උප අංශවල ඉහළ යෑම් වාර්තා විය. තවද, දේශීය සංචාරක ව්‍යාපාරයේ වර්ධනය ද මේ සඳහා සැලකිය යුතු ලෙස දායක විය. මේ අතර, වෙළෙඳපොළ පොලී අනුපාත පහළ මට්ටමක පවත්නා පසුබිමක් තුළ, ණය ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන්, මූල්‍ය සේවා උප අංශය ද අගෝස්තු මාසය තුළ තවදුරටත් වර්ධනය විය.

2023 ජූලි මාසයේ වාර්තා වූ ඉහළ යෑමෙන් පසු, සේවා නියුක්තිය එම මට්ටමේම නොවෙනස්ව පැවතුනි. මේ අතර, අගෝස්තු මාසයේ දී, නිමකිරීමට නියමිත කාර්යයන් අඩු වේගයකින් වුවද පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **59.5** | **57.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| **උපදර්ශක** | | | | |
| නව ව්‍යාපාර | 62.0 | 62.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 67.5 | 58.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.0 | 50.0 | - | ඉහළ යෑමක සිට නොවෙනස්ව පැවතීමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.1 | 47.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.7 | 69.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2023 අගෝස්තු මාසයේ දී අඩු වේගයකින් වුවද අඛණ්ඩව ඉහළ ගිය අතර, මේ සඳහා ආනයන සීමා ලිහිල් කිරීම මධ්‍යයේ ඉල්ලුම් තත්ත්වයන් වර්ධනය වී ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කිරීම හේතු විය.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 අගෝස්තු මාසයේ දී 51.1ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 අගෝස්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, එක්සත් රාජධානියේ සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අනුව එහි සේවා ක්‍රියාකාරකම්වල පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 සැප්තැම්බර් 14වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.